# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1823/70 - 2013 අගෝස්තු මස 16 වැනි සිකුරාදා - 2013.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ජෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2010 නොවැම්බර් මස 22 වැනි දිනැති 1681/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2013 අගෝස්තු මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය (අංක 1 ) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

*(අ)* එහි I වැනි තීරුවෙහි 8 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

*(ආ)* එහි II වැනි තීරුවෙහි 6 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;

*(ඇ)* එහි III වැනි තීරුවෙහි කියැවෙන "පොලිස් ආඥා පනත" යන අයිතමය ඉවත් කිරීමෙන් ;

(2) එම නිවේදනයෙහි අධ්‍යාපන සේවා අමාත්‍ය (අංක 68) ශීර්ෂයේ I වැනි, II වැනි සහ III වැනි තීරුවලට පසුව පහත සඳහන් නව ශීර්ෂය ඇතුළත් කිරීමෙන් :-

(69) නීතිය හා සාමය පිළිබඳ අමාත්‍ය



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු පනත්* |
|---|---|---|
| 1. මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා මහජන ආරක්ෂාව සහ නීතිය හා සාමය පවත්වාගෙන යාම මගින් විනය ගරුක රටක්, සාරධර්ම පිරි රාජ්‍යයක් ගොඩනැගීම සඳහා අදාළ වන විෂයයන්ට හා II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තුව හා ඒ යටතේ වන ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම | 1. පොලිස් දෙපාර්තමේන්තුව | * පොලිස් ආඥාපනත<br>* දැනට ක්‍රියාත්මකව පවතින හා වෙනත් අමාත්‍යාංශයක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 2. අදාළ අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමග එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම | | |
| 3. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම | | |
| 4. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම | | |
| 5. නීතිය හා සාමය පවත්වා ගෙන යාම | | |
| 6. රථවාහන ගමනා ගමන පාලනය | | |
| 7. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන් | | |
| 8. II තීරුවෙහි දැක්වෙන ආයතනය අධීක්ෂණය කිරීම | | |

09 - 32

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.